# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 63/8—1979 නොවැම්බර් 21 වැනි බදාදා—1979.11.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

145 වන වගන්තිය යටතේ නියමය

උසස් අධ්‍යාපන අමාත්‍ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න වන මම, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 145 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි, මේ නියමයෙන්—

(i) මෙහි උපලේඛනයෙහි I වන තීරයෙහි සඳහන් කරනු ලැබ ඇත්තාවූ ද ඉහත කී පනතේ 139 වන වගන්තිය මගින් ඒ පනත යටතේ පිහිටුවන ලද සේ සලකන්නාවූ ද එක් එක් විශ්ව විද්‍යාලයට, 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය වෙනුවෙන් සහ උදෙසා එම උපලේඛනයෙහි II වන තීරයෙහි ඊට අනුරූපව දක්වා ඇති ඉහත කී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ මණ්ඩපයෙහි ශිෂ්‍යයන් වූ, 1979 දෙසැම්බර් මස 31 වැනි දිනට හෝ ඊට පෙර නියමිත විභාගවලින් සාමාර්ථ්‍යය ලබා එම උපාධි, අභිඥන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා අවශ්‍යතාවන් සපුරා ලන ලද තැනැත්තන්ට උපාධි, අභිඥන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සහ පිරිනැමීමට; සහ

(ii) (1) වන ඡේදය ප්‍රකාර නිකුත් කළයුතු උපාධි, අභිඥන පත්‍ර සහ වෙනත් සහතික පත්‍ර එකී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය වෙනුවට හා උදෙසා අත්සන් කිරීමට, එම උපලේඛනයෙහි I වන තීරුවෙහි දක්වා ඇති එක් එක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට සහ ලේඛකාධිකාරිවරයාට

බලය පවරමි.

නිශ්ශංක විජයරත්න,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

1979 නොවැම්බර් මස 21 දින,
කොළඹදී ය.

### උපලේඛනය

| I වන තීරුව | | II වන තීරුව |
|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | ... ... | කොළඹ |
| පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව | ... ... | පේරාදෙණිය |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව | ... | විද්‍යෝදය |
| කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | ... ... | විද්‍යාලංකාර |
| මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව | ... ... | කටුබැද්ද |
| යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව | ... ... | යාපනය |

1A—ජ46323—3,650 (79/11)